දකුණු පළාත ..................

ශ්‍රී ලංකාවේ දක්ෂිණ ප්‍රදේශයේ පිහිටා ඇති දර්ශණීය වෙරළ තීරයකින් වටවූ දකුණු පළාත, ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03 කින් හා වර්ග කි.මී. 5,544 බිම් ප්‍රමාණයකින් සමන්විත වේ. 2019 වර්ෂයේ ඇස්තමේන්තුගත ජනගහනය 2,654,000 කි. දකුණු පළාතේ අග නගරය ගාල්ල දිස්ත්‍රික්කය වේ. සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් සුළු ජන වර්ගවලින් සමන්විතව බහුජාතීන්ගෙන් සැදුම්ලත් දකුණු පළාත, ඓතිහාසික හා පෞරාණික නටඹුන් රැසකින් පිරි දැකුම්කළු රමණීය පළාතකි.

කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය මෙහි ප්‍රධාන ජීවනෝපාය මාර්ගයන් ලෙස දැක්විය හැක. බස්නාහිර පළාත හා සැසඳීමේදී මෙම ප්‍රදේශයේ ආර්ථික තත්වයෙහි සුළු පසුගාමීත්වයක් පෙන්නුම් කරයි. උසස් අධ්‍යාපනය ලැබූවෝ අග නගරයට සංක්‍රමණය වීම මෙහි කර්මාන්ත සංවර්ධනයේ පසුගාමීත්වයට එක් හේතුවකි.

සම්ප්‍රදායික ඖෂධයක් වශයෙන් හා චිත්තාකර්ශනීය පුෂ්පයක් ලෙසත් ප්‍රචලිත හීන් බෝවිටියා මල දකුණු පළාතේ ජාතික පුෂ්පය ලෙසද ජාතික ධජයට බොහෝ සේ සමානව කහතීරයකින් මායිම් වූ දුඹුරු රතු පැහැති ධජයේ සිවු කොනෙහි බෝපත් 4 ක් හා පසුතලය මධ්‍යයේ අසිපතක් රැගත් සිංහයා සහ සිංහයාගේ දෙපස ඉර හා හඳ සංකේතවත් කර ඇති පුරාණයේ දුටුගැමුණු මහරජු භාවිතා කරන ලද ධජය දකුණු පළාත් ධජය වශයෙන්ද හඳුන්වා දී ඇත.

ගාල්ල, මාතර වැනි පෞරාණික නගර, තිස්සමහාරාම, දෙවුන්දර, වැවුරුකන්නල, කිරින්ද, මුල්කිරිගල වැනි පෞරාණික ස්ථාන මෙම ප්‍රදේශයට අයත් වැදගත් ස්ථාන ලෙස දැක්විය හැක. යාල සහ උඩවළව ජාතික වනෝද්‍යාන, යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුමයක් වශයෙන් නම්කරන ලද සිංහරාජ නිවර්තන වැසි වනාන්තරය, සත්මහල් ඇල්ල, දූලි ඇල්ල, ගිං, නිල්වලා හා වලවේ ගංගා මෙන්ම තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හුම්මානය හා මදුනාගල උණුදිය උල්පත් දකුණු ලක අප ලද වටිනා සම්පත් වේ. පොදු ජනතාව පිළිබඳව කවි ලියූ දික්වැල්ලේ විසූ අන්දරේ සහ මාතර දිස්ත්‍රික්කයට අයත් දෙනිපිටියේ විසූ ගජමන් නෝනා පෘතුගීසි පාලන සමයේ සිටි සුප්‍රසිද්ධ කවීන් දෙදෙනෙකි. පියදාස සිරිසේන, මාර්ටින් වික්‍රමසිංහ වැනි සාහිත්‍ය පෝෂණය කළ අගනා දායාදයන් ලක්මවට තිළිණ වූයේ දකුණු ලක අප පුරවරයෙන් වීම ඉමහත් ආඩම්බරයකි.